## මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කම්කරු තනතුරට බඳවා ගැනීම - 2018

මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අතරින් අදුම්පත් කැඳවනු ලැබේ.

*01. පොදු කොන්දේසි :*

1.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

1.2 අයදුම්කරු මධ්‍යම පළාතේ පදිංචිකරුවෙකු විය යුතු ය.

1.3 සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 03 ඇතුළත මධ්‍යම පළාත තුළ යටත් පිරිසයෙන් අවුරුදු 03ක අඛණ්ඩ ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙකු විය යුතු ය.

1.4 අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

1.5 තනතුරට බඳවා ගැනීමට අදළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන 2018.10.04 වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

*02. වයස් සීමාව :*

2018.10.04 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

*03. අධ්‍යාපන සුදුසුකම්:*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ EST - 2/RECRU/02/0365 අංක දරන 2013.12.31 දිනැති ලිපිය අනුව)

*04. කායික සුදුසුකම් :*

සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*05. බඳවා ගැනීමේ ක්‍රමය 1 :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

තනතුරේ ස්වභාවය අනුව දැනටමත් දෙපාර්තමේන්තුවේ සේවය සමග බද්ධ වූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීමට සලකා බලනු ලැබේ.

*06. පුරප්පාඩු ගණන :*

පුරප්පාඩු ගණන - 12
පළමු අදියරේ බඳවා ගන්නා ගණන - 06
දෙවන අදියරේ බඳවා ගන්නා ගණන - 06

*07. තනතුරට හිමි වැටුප් පරිමාණය :*

රා.ප.චක්‍රලේඛ 03/2016හි PL 1 - 2016 වැටුප් පරිමාණය
රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි හා අනෙකුත් කරුණු තීරණය වේ.

09. *තනතුරේ ස්වභාවය :*

ඩයි දැමීම, රෙදි සේදීම ඇතුළු ඩයි මධ්‍යස්ථානවල රාජකාරි.

10. *අයදුම් කිරීමේ ක්‍රමය :*

10.1 ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 1-6 දක්වා පළමු වන පිටුවට ද අංක 7-11 දක්වා දෙවන පිටුවටද ඇතුළත් වනසේ අයදුම්පත් සකස් කළ යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.10.04 වැනි දිනට පෙර "ලේකම්, මධ්‍යම පළාත් ක්‍රීඩා හා කර්මාන්ත අමාත්‍යාංශය, තැ.පෙ. 41, ගැටඹේ, පේරාදෙණිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කම්කරු තනතුරට බඳවා ගැනීම - 2018 යනුවෙන් සඳහන් කළ යුතු ය. (දැනටමත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.)

10.2 අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අදාළ කරුණු හෝ එම නිවේදනයේ අනාවරණය නොවන වෙනත් කරුණක් වේතොත් ඒ පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්. එම්. කේ. කේ. කරුණාරත්න,
ලේකම්,
මධ්‍යම පළාත් ක්‍රීඩා හා කර්මාන්ත අමාත්‍යාංශය.

මධ්‍යම පළාත් ක්‍රීඩා හා කර්මාන්ත අමාත්‍යාංශය,
තැ.පෙ. 41, ගැටඹේ, පේරාදෙණිය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

**මධ්‍යම පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කම්කරු තනතුරට බඳවා ගැනීම**

1. 1.1 මුලකුරු සමග නම : ..............................................................................

1.2 මුලකුරුවලින් දැක්වෙන නම් :..............................................................................

..............................................................................

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................

2 2.1 ස්ථිර ලිපිනය : ..............................................................................

2.2 දුරකතන අංකය : ..............................................................

3. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ..............................................................

3.2 උපන් දිනය : ..............................................................

3.3 2018.09.30 වැනි දිනට වයස : අවු : ........................................... මාස : ..............................................

3.4 පදිංචි දිස්ත්‍රික්කය : ..............................................................

3.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..................................................

4. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය : ..................................................................

5. අධ්‍යාපන සුදුසුකම් : ........................................................................................................................
........................................................................................................................................................
........................................................................................................................................................

6. වෙනත් සුදුසුකම් :
........................................................................................................................................................
........................................................................................................................................................
........................................................................................................................................................

7. ඔබ පළාත් රාජ්‍ය සේවයේ,

7.1 දැනට දරන තනතුර හා පත්වීම් දිනය : ....................................................

7.2 තනතුර ස්ථිර/තාවකාලික/අනියම් ද යන වග : .......................................

7.3 දැනට සේවය කරන ආයතනය සහ රාජකාරි ස්වභාවය : ...................................................

7.4 සේවා කාලය : ..............................................................

8. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කරන තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් සේවයෙන් ඉවත් කිරීමට යටත් වන බව දනිමි. තව ද මෙම සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්/මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්/මධ්‍යම පළාත් ක්‍රීඩා හා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් තොරතුරු පසුව වෙනස් නොකරමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.......................................

9. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................................... මයා./මිය./මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය ......................................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන තැබූ බව ද සහතික කරමි.

...........................................................................................,
සහතික කරන නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :.....................................

10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

..........................................................................මයා./මිය./මෙනෙවිය ............................................... ආයතනයේ ............................... දින සිට .............................................. තනතුරක සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද, මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පත්වීම සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කරන බවත් ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරමි.

.............................................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය : ................................................